# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,419 - 2025 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2025.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 30 |


applications.lk Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජනවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

27- B 082644 — 5,403 (2025/01)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අධිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඬේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

අංක 1925/37 හා 2015.07.28 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2025 මාර්තු මස කොළඹ දී** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ජනවාරි මස 10 වැනි දින පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2025 පෙබරවාරි මස 14 වැනි දින ප.ව. 9.00**ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන ඉහත සඳහන් සේවා ව්‍යවස්ථාවේ උපලේඛන III යටතේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

**02. විභාග පටිපාටිය - ලිඛිත පරීක්ෂණය**

| *විෂයය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය (පැය)* |
|---|---|---|---|
| 01 | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු | 100 | 1 1/2 |
| 02 | මුදල් රෙගුලාසි | 100 | 1 1/2 |
| 03 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය | 100 | 02 |
| 04 | Communication Skills | 100 | 02 |

**03. විෂය නිර්දේශය :**

| *විෂයය අංකය* | *විෂයය* | *විෂයය අන්තර්ගතය* |
|---|---|---|
| 01 | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු | රජයේ ආයතන සංග්‍රහයේ I, II, III, IV, V, VII, VIII, IX, XII, XIII, XIV, XXIV, XXVIII, XXX සහ XXXI යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I, III, IV, V, VI, VIII, X හා XII යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව |
| 02 | මුදල් රෙගුලාසි | රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ I, II, V, VIII, XII හා XIV පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව |
| 03 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය | අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ.<br>i. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (අධ්‍යාපනයේ නව මඟ)<br>ii. 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව |

Applications.lk Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

| *විෂයය අංකය* | *විෂයය* | *විෂයය අන්තර්ගතය* |
|---|---|---|
| | | iii. 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වන වාර්තාව<br>iv. 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ<br>v. 1999 සිට ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (ප්‍රාථමික, ද්විතියික හා අ.පො.ස.(උ.පෙළ)<br>vi. 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත<br>vii. 1986 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත<br>viii. 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත<br>ix. 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත<br>x. 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත<br>xi. 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව<br>xii. අධ්‍යාපනයට අදාළ පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති |
| 04 | Communication Skills | This is to assess the English language competence of the following subject areas.<br>- *English Grammar* :-<br>Tense and Number, Sentences (Simple/ Compound / Complex / Compound Complex), Relative Clauses, Adjectives and Adverbs, prepositions<br>- *Listening and speaking Skills* :-<br>General Greetings and Introductions, Giving and getting information, Advising, Suggesting and Expressing Opinions, Telephone Skills, Interviewing Skills, Meeting<br>- *Writing Skills* :-<br>Internal modes of communication, Formal correspondence skills, Writing Descriptions/ Explanations, Summary Writing skills, Report Writing skills |

***සැ.යු*** :- අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා යටත් පිරිසෙයින් ලකුණු 40% ක ප්‍රමාණයක් ලබා ගත යුතුය.

***සටහන*** :- උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇති විට මෙම කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇති ඉංග්‍රීසි විෂය සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ.

04. විභාගයේ භාෂා මාධ්‍ය :

4.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. විභාගය සඳහා ඉල්ලුම්කරනු ලැබූ භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට ඇතුළු වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යම මෙම විභාගයේ භාෂා මාධ්‍ය ලෙස තෝරා ගත යුතුය.

4.3 අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සළකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප

කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.
මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹදී පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ව්‍යාජ තොරතුරු සැපයීම සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ විධිවිධාන අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව, ව්‍යාජ තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

08. අයදුම්පතේ මුද්‍රිත පිටපත 2025 පෙබරවාරි මස 14 වැනි දින හෝ ඊට පෙර " විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

09. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එම නීති පිළිපැදීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය. යම් හෙයකින් විරෝධතාවක් මතු කළහොත් විභාගයට පෙනී සිටීමට ඉඩදිය හැක. කෙසේ වුව ද අනන්‍යතාව තහවුරු කර ගැනීමට නොහැකි බැවින් එවැනි අපේක්ෂකයින්ට ප්‍රතිඵල නිකුත් නොකෙරේ.

10. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් මෙම විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් පුවත්පත් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීමේ ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. ඉහත 10 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.

12. විභාග සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් සහතික කර තිබිය යුතුය. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත්

ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

13. විභාග ගාස්තු:

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ආ) මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතු ය.

i. පළමු වැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

ii. ඊට පසු එක් වතාවක් සඳහා පහත සඳහන් පරිදි විභාග ගාස්තු අයකරනු ලැබේ.

| | |
|---|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව | රු.500/- කි |
| එක් විෂයයකට ගාස්තුව | රු.250/- කි |

විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions),

iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon),

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

***සටහන :***

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

14. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනයක් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු නොකරනු ඇත.

15. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතින බව පෙනී යන්නේ නම් සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

17. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

නාලක කලුවැව,
ලේකම්.
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 ජනවාරි මස 02 වැනි දින,
අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වූ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

First Bar Examination for the Officers in Grade III of Sri Lanka Teacher Educators' Service-2025

අයදුම්පත "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ." යන ලිපිනයට ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. (විභාගයේ නම කවරයේ වම් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය:- සිංහල ) 2 ☐
දෙමළ ) 3 ☐
ඉංග්‍රීසි ) 4 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්: ..........................................................................
(උදා : GUNAWARDHANA, H.M.S.K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................................

02. (i) සේවය කරන විද්‍යාපීඨය / ගුරු විද්‍යාලය / ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට යොමු කරනු ලැබේ :
..........................................................................................................
(ii) පෞද්ගලික ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................

03. දුරකථන අංකය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| (i) ජංගම : | | | | | | | | | | |
| (ii) ස්ථාවර : | | | | | | | | | | |

04. (i) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ii) ස්ත්‍රී/ පුරුෂ භාවය: පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1

05. (i) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) පදවි නාමය : ......................................................

Applications.lk Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

06. නිවේදනයේ දෙවන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂයය අංකය හා විෂයය සහිතව අයදුම්කරන විෂයයන් පැහැදිළිව සඳහන් කළ යුතුය. :-

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේ ද එසේ නම් එම විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍ය සඳහන් කරන්න :-

| *විෂයය* | *වර්ෂය* | *මාධ්‍යය* | *විභාග අංකය* |
|---|---|---|---|
| | | | |
| | | | |

08. ( i ) ඔබ විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවෙක් ද? ( ඔව් / නැත )
( ii) ඔව් නම් විශේෂ අවශ්‍යතාවේ ස්වභාවය : ………………………………………………………………………………………..
……………………………………………………………………………………………………………………………..

09. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, *ගැසට්* නිවේදනයේ 04 වන ඡේදයට අනුව දක්වා ඇති භාෂා මාධ්‍යයන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

................................,
දිනය :-......................................... අයදුම්කරුගේ අත්සන.

10. අත්සන සහතික කිරීම :
මාගේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ / ගුරු විදුහලේ / ගුරු මධ්‍යස්ථානයේ නිලධාරියකු / නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..................................................... මයා / මිය / මෙනවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.....................................................,
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව
(ආසන්නතම මාණ්ඩලික නිලධාරියා)

නම : …………………………………………..…..
පදවි නාමය: ………………………………………..
ලිපිනය : ……………………………………...…
දිනය : ………………………………………..…..

11. විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට / අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 04 වැනි ඡේදයට අනුව ඔහු / ඇය දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත්

Applications.lk All Vacancies / Courses / Examinations / Gazettes / Application

මම සහතික කරමි. අපේක්ෂකයා/ අපේක්ෂිකාව විභාග ගාස්තුවෙන් නිදහස් බවත් / නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

.........................................................,
පීඨාධිපතිගේ/ගුරු විදුහල්පතිගේ/මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන.

පදවි නාමය : ......................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදාළ නොවන වචන කපා හරින්න.)

01-194

---

## ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය

(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

ව්‍යාපාර සැළසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳ විධායක ඩිප්ලෝමා පාඨමාලාව 2025/2026
(අතිරේක බඳවාගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යාපාර සැළසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳ විධායක ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, උසස් පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, ව්‍යාපාර අංශයෙන් අධ්‍යාපනයේ නිරත ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, ව්‍යාපාරයක් ඇරඹීමට සිටින හෝ විදේශගත වී සිටින, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින හෝ ව්‍යාපාර කළමනාකරණය, සැලසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

සුදුසුකම් : අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත්වීම ; හෝ
වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සම්පූර්ණ අර්ස (Total credits) : 30කි.
සාමාසික ගණන : සාමාසික 02 කි.
ඩිප්ලෝමාවේ ස්වභාවය : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)
ඉගැන්වීම් ක්‍රමවේදය : සජීවී ඉගැන්වීම්. පහසු දිනයක් තුළදී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදුකෙරේ.
මාධ්‍ය : සිංහල හෝ ඉංග්‍රීසි
පාඨමාලා කාලය : මාස 12 කි

පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු : ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 36,000.00 කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේදී රු. 1000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය.

රු. 36,000.00 ක මුදල එකවර හෝ වාරික 12 කින් ගෙවා අවසන් කළ හැකිය.

පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය : අයදුම්කරුවන් විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කළහැකි ලේඛනයක ඡායාරූප (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය/ගුවන් ගමන් බලපත්‍රය),
2. අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහ වෘත්තීය සහතික ඡායාරූප,
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක්,

071 913 6683 (WhatsApp) අංකයට යොමු කළ යුතුය.

පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය :2025.01.27 වේ.

වැඩි විස්තර සඳහා : කාර්යාල වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 0813169800 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

01 - 66/1

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.)

අධ්‍යයන, සෞඛ්‍ය සහ වෘත්තීය පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව 2025

(ප්‍රධාන බඳවාගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ අධ්‍යයන, සෞඛ්‍ය සහ වෘත්තීය පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, උසස් පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, ඕනෑම අංශයක් යටතේ අධ්‍යාපනයේ නිරත ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, විදේශගත වී සිටින, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින පිරිස්, සමාජයේ නව දැනුම නිර්මාණය කිරීමට උත්සුක පිරිස්හට සෞඛ්‍ය අංශයේ පිරිස සහ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

සුදුසුකම් : අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත්වීම

හෝ

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

ඩිප්ලෝමාවේ ස්වභාවය : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)
ඉගැන්වීම් ක්‍රමවේදය : සජීවි ඉගැන්වීම්, පහසු දිනයක් තුළ දී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදු කෙරේ.

මාධ්‍ය : සිංහල හෝ ඉංග්‍රීසි

පාඨමාලා කාලය : මාස 06 කි

පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු : ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 18,000.00 කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේදී රු. 1000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය. රු. 18,000.00 ක මුදල එකවර හෝ වාරික 06කින් ගෙවා අවසන් කළ හැකිය.

පාඨමාලාව සඳහා අයදුම්කළ යුතු ආකාරය : අයදුම්කරුවන් විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කළහැකි ලේඛනයක ඡායාරූප (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය/ගුවන් ගමන් බලපත්‍රය),
2. අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහ වෘත්තීය සහතික ඡායාරූප,
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක්

071 913 6683 (WhatsApp) අංකයට යොමු කළ යුතුය.

පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය :2025/02/08 වේ.

වැඩි විස්තර සඳහා : කාර්යාල වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 081 316 9800 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

01-66/2

---

**මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව

**රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ -2 හි**
**II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහාවන**
**විවෘත තරග විභාගය - 2024**

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට 184 දෙනකු බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2025 මාර්තු මාසයේ දී කොළඹ දී**

පමණක් පවත්වනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය යථා කාලයේ දී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය රජයේ ප්‍රධාන තක්සේරුකරු සතුවේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම්:-

I අධ්‍යාපන සුදුසුකම් :-
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවරුන්ගේ රාජකීය ආයතනයේ සාමාජිකත්වය සහිත වරලත් තක්සේරුකරුවකු වීම.

II කායික සුදුසුකම්:-
සෑම අපේක්ෂකයකු ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

III වෙනත් සුදුසුකම්:-
(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් **2024 දෙසැම්බර් 31** දිනට සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

02. වයස:-
I අවම සීමාව :- අවු. 21 ට නොඅඩු
II උපරිම සීමාව :- අවු.35 ට නොවැඩි
(ඒ අනුව 2003.12.31 දිනට හෝ ඊට පෙර හා 1989.12.31 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

සටහන :-
I යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ ලබා නොදෙනු ඇත.

II උපාධියට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිදු අපේක්ෂකයකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුවද ඉහත සුදුසුකම්වලට අදාළ උපාධිය සමත් වූ අයකුට ඔහු/ඇය එම උපාධිය 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර ඇති බවට එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිගෙන් ලබාගත් නිල ලිපියක් ඉදිරිපත් කළ අවස්ථාවක දී එය සනාථ කර ගැනීමෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ ලබාදෙනු ඇත.

03. සේවා කොන්දේසි :

I වැටුප- මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත දැක්වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි අනුව වැටුප් පරිමාණය MN 5 දරන වැටුප් ඛණ්ඩයේ රු. 34 605-10 X 660-11 X 755-15 X 930 – 63 460/- ක් වේ.

II මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය.

III තෝරාගත් අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු (03) පරිවාස කාලයට යටත්ව පත් කරනු ලැබේ.

IV පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසුද නැතිද යන වගට ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුවේ.

V පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිනු ඇත.

VI රාජ්‍ය සේවා කොමිෂන් සභා අංක: 2310/29 හි සඳහන් කාර්ය පටිපාටික රීතිවල සඳහන් කොන්දේසිවලට හා මෙම *ගැසට්* පත්‍රයේ 1 වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම් වලට අදාළ පොදු කොන්දේසිවලටද අවධානය යොමු කෙරේ.

VII මෙම තනතුර අංක: 2142/75 හා 2019.09.27 දිනැති ගැසට් නිවේදනයේ පළකර ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පවතින විධිවිධානවලට අනුව පාලනය වනු ඇත.

04. බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලබන අතරම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා නොදේ. එහිදී, අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ.

05. විභාග පරිපාටිය:-

බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| විෂය අංක | ප්‍රශ්න පත්‍රයේ නම | කාලය පැය/විනාඩි | සමත් වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය බුද්ධි පරීක්ෂණ හා අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය | පැය 2 | 40 | 100 |

(අ) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණ හා අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය
ගණිතමය, තාර්කික, විෂයන්ට අදාළ බහුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න ඇතුළත් වේ.

**සටහන :-**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගය සඳහා අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(I) නොපැහැදිලි අත් අකුරු හා වැරදි අක්ෂර වින්‍යාසයටද ලකුණු අඩු කරනු ලැබේ.

(II) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කර ඇති අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැළකිය යුතුය.

(III) ඇගයීමේ ක්‍රමය: තරග විභාගයේ දී ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ලකුණුවලට අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඔවුන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අපේක්ෂකයාගේ සිට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුපාතිකව අපේක්ෂකයින් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. තෝරා ගැනීමේ පදනම:
ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් අදාළ බඳවා ගැනීම සඳහා පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලැබේ.

(1) ප්‍රතිඵල නිකුත් කිරීම :
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ලිඛිත විභාගයේ මුළු ලකුණු කුසලතාවය අනුව සකස් කර අවසන් ප්‍රතිඵල ලේඛනය ප්‍රධාන තක්සේරුකරු වෙත ලබාදෙනු ඇත. තනතුරට අදාළ පත්වීම අවසන් බව ප්‍රධාන තක්සේරුකරු විසින් දැන්වීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තැපැල් මඟින් සිදු කරනු ලැබේ.

07. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

applications.lk Vacancies / Courses / Examinations / Gazettes / Applications

08 ඉල්ලුම් කිරීමේ පිළිවෙල :-

ආදර්ශ අයදුම්පත :

(1) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙළ කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා “අදාළ නොවේ” යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතුය. (ආදර්ශ අයදුම්පතේ 01 සිට 05 තෙක් ශීර්ෂ 1 වන පිටුවට ද, 06 සිට 11 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ඉතිරිය තුන්වන පිටුවට ද වනසේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න). අයදුම්පත පිළියෙළ කිරීමේ දී විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය : 2025.02.07

(II) අයදුම්පත් 2025 පෙබරවාරි මස 07 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් “ රජයේ ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු මන්දිරය, අංක 748, මරදාන පාර, කොළඹ 10” ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය” ලෙස විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

විභාග ගාස්තු:

(III) රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගේ ආදායම් ශීර්ෂ අංක 236100189026654 යටතේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 1000/-ක මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකරනු ඇත. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම යෝග්‍ය වේ.

දැනටමත් සේවයේ යෙදී සිටින්නන්ගේ අයදුම්පත්:

(IV) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. 2025.02.07 දින හෝ ඊට ප්‍රථම රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට හෝ එම ආයතනයේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය.

දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුවද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීමේ දී අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

අයදුම්පත් සහතික කිරීම :

(V) දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි.

09. විභාග ප්‍රවේශ පත්‍ර :

(I) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත් සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අයදුම්කරුවකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ඒ පිළිබඳව දන්වා සිටිය යුතුය. එහිදී

අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායි වේ. එහිදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපත විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත.

විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර සහතික කර ගැනීම:

(II) දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියකු, රජයේ ස්ථිර සේවයේ මාණ්ඩලික නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතුය.

විභාගයට ඇතුළත්කර ගැනීම :-

(III) විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකු ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතුය.

විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්, විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අපේක්ෂකයකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නො ලැබෙනු ඇත.

(IV) අයදුම්පත ලැබුණ බව අයදුම්කරුවන්ට දන්වනු නොලබන අතර, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**සටහන: -** විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාගයට පෙනී සිටීමට හෝ තනතුර සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකේ.

10. අනන්‍යතාව :-අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින විෂය සඳහා විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රයක්)
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11. සාවද්‍ය තොරතුරු සැපයීම:- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවත් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවකදී ඔප්පු වුවහොත්, හෝ ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය ප්‍රධාන තක්සේරුකරුගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැඟුනහොත් එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

ඒ. එස්. ඩබ්. කේ. නානායක්කාර
රජයේ ප්‍රධාන තක්සේරුකරු

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධර බණ්ඩ 02 හි
II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024

**සැ.යු:** අයදුම්පත බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහළින් ශ්‍රී ලංකා තක්සේරු සේවයේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධර බණ්ඩ 02 හි II පන්තියේ II ශ්‍රේණියේ "සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 "යනුවෙන් සඳහන් කළ යුතු අතර, අයදුම්පත ලියාපදිංචි තැපැලෙන් " රජයේ ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු මන්දිරය, අංක 748, මරදාන පාර, කොළඹ 10" යන ලිපිනයට එවිය යුතු ය.

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2,දෙමළ - 3, ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

(1) අයදුම්කරුගේ නම:

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :

..........................................................................................................

ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (උදා : SILVA, A.B.)

1.2 සම්පූර්ණ නම :

..........................................................................................................

..........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :

..........................................................................................................

..........................................................................................................

(සිංහලෙන් / දෙමළෙන්)

(2) පෞද්ගලික ලිපිනය :

සිංහලෙන්/ දෙමළෙන් : ..........................................................................................

..........................................................................................................
(ලිපිනය වෙනස් වුවහොත් ඒ බැව් වහාම දැන්විය යුතු ය.)

ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

..........................................................................................................
..........................................................................................................

Applications.lk Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

(3) ස්ත්‍රී / පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(4) ජාතික හැඳුනුම්පත් අංකය :

(5) ජංගම දුරකතන අංකය :

(6) විවාහක / අවිවාහක : (අවිවාහක - 1, විවාහක - 2)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(7) ජන වර්ගය ; (සිංහල - 1, දෙමළ - 2, ඉ.දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(8) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

(9) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ පෙළපතින් ද? ලියාපදිංචි කිරීමෙන් ද? යන්න සඳහන් කරන්න.
(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න)

(10) *අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම්* :

| *විභාගය / උපාධිය* | *ක්‍රියාත්මක වන දිනය* | *විශ්ව විද්‍යාලය/ආයතනය* | *විෂයන්* |
|---|---|---|---|
| | | | |

(11) වර්තමාන රැකියාව සහ ඉහත දී යම් තනතුරක් දැරුවේ නම් ඒ පිළිබඳව විස්තර :

| *තනතුර* | *සිට* | *දක්වා* | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|
| | | | |

Applications.lk Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

(12) ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේ ද ?
(එසේනම් විස්තර දක්වන්න)

(13) ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වේ නම්) දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද ?

(14) ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද?

(15) විභාග ගාස්තුව (ලදුපතෙහි මුල් පිටපත අමුණා තිබිය යුතු ය)

i. මුදල් ගෙවන ලද මහජන බැංකු ශාඛාව : ....................................................................
ii. ගෙවූ මුදල : ......................................
iii. ගෙවූ දිනය : ......................................
iv. ලදුපත් අංකය : ...................................

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපතෙහි මුල් පිටපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ඡායා පිටපතක් ලග තබාගන්න.) |
|---|

(16) *අයදුම්කරුගේ සහතිකය* :

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. එහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා සියලු අයිතිවාසිකම් රහිතව, මා සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම දනිමි.

තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.............................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : .................................

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න)* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................... (සම්පූර්ණ නම) මහතා / මහත්මිය / මෙනවිය යන අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ ඇය 2025 ............................. මස ...............වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

.................................................
සහතික කරන්නාගේ අත්සන
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ...................................................................................................
තනතුර : ...............................................................................................................................
ලිපිනය : .......................................................................................................................
(නිල මුද්‍රාව තබන්න)
දිනය : ............................

*අයදුම්කරු රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත නම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................... මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු /ඇය ........................................................................... (අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / රාජ්‍ය සංස්ථාවේ ) සේවයේ නියුක්ත බවත්, ඔහුට / ඇයට එරෙහිව විනය පරීක්ෂණ කිසිවක් නොමැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය .....................................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. (තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.)

ඔහු / ඇය ශ්‍රී ලංකා තක්සේරු සේවයේ ක්ෂේත්‍ර / කාර්යාලගත නිලධර ඛණ්ඩ 02 හි II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරකට පත්කිරීම සඳහා තෝරා ගතහොත් මෙම දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ සේවයෙන් මුදාහැරිය හැකි ය.

.................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ සම්පූර්ණ නම :
.........................................................................................................................
තනතුර :
.........................................................................................................................
කාර්යාලයීය ලිපිනය :
.........................................................................................................................
(නිල මුද්‍රාව තබන්න)

දිනය : .............................

01-60

---

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
(ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

## සමාජ වැඩ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම - 2024/2025 අධ්‍යයන වර්ෂය

ජාතික සමාජ සංවර්ධන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයකි. එය සමාජ වැඩ වෘත්තීය අධ්‍යාපනය ලබා දෙන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනය ද වෙයි. දැනට මෙම ආයතනය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර මෙම ආයතනය මගින් පිරිනමනු ලබන පූර්ණ කාලීන සිව් අවුරුදු සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලබයි.

අයදුම් කිරීමේ සුදුසුකම් :

2021, 2022 සහ 2023 යන වර්ෂවල දී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී ඕනෑම විෂයධාරාවකින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් මෙම පාඨමාලාව සඳහා අයදුම් කළ හැකිය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය හැදෑරීමට අයදුම් කිරීම සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂය සඳහා හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම අනිවාර්ය වෙයි.

Applications.lk Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

උපාධිය පැවැත්වෙන මාධ්‍ය : සිංහල/දෙමළ/ඉංග්‍රීසි

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්, පාඨමාලාව හැදෑරීමට අයදුම් කළ මාධ්‍යයෙන් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර ලිඛිත පරීක්ෂණයේ හා සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවය මත තෝරා ගැනීම් සිදුකරයි. තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය අයදුම්පත් කැඳවන අවසාන දිනයෙන් පසු ආසන්න දිනක දී කොළඹ දී හෝ පළාත් මට්ටමින් පවත්වනු ලබයි. තෝරා ගැනීමේ ලිඛිත සාමාන්‍ය දැනීම හා අභියෝගතා ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වෙයි.

පාඨමාලා ගාස්තු : මෙම සිව් අවුරුදු පූර්ණ කාලීන උපාධි පාඨමාලාව නොමිලේ පවත්වනු ලබන අතර ලියාපදිංචි ගාස්තු වශයෙන් රුපියල් 35,000 ක මුදලක් පමණක් අයකරනු ලබයි.

අයදුම් කරන ආකාරය :

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් (www.nisd.ac.lk) මාර්ගගතව (online) පමණක් අයදුම්පත් යොමු කළ යුතුය.

අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය : 2025 පෙබරවාරි මස 10 වැනි දින.

ලේඛකාධිකාරී
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදූව.

දුරකථන : 0112882506
Email : registrar@nisd.ac.lk

01-183

Applications.lk Job Vacancies / Courses / Examinations / Gazettes / Applications